# සූරියවැව ප්‍රාදේශීය සභාව
# හම්බන්තොට දිස්ත්‍රික්කය

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 23 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 03 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජූලි 31 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති සූරියවැව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණයේ පැවැති ක්‍රිකට් තරඟාවලියක් වෙනුවෙන් 2012 මැයි 24 දින අංක 10426 දරන ලදුපතින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් රු. 2,775,600 ක මුදලක් විනෝද බදු වශයෙන් සභාවට ලැබී තිබූ අතර ප්‍රධාන ලෙජරයේ ආදායම් වෙනුවෙන් තැන්පත් ගිණුමට එම මුදල බැර කරනු වෙනුවට හරකර තිබුණි. මෙම මුදලින් නොවිකුණූ ටිකට්පත්වල වටිනාකම ලෙස යලි රු. 1,043,760 ක මුදලක් ක්‍රිකට් ආයතනය වෙත ආපසු ගෙවා තිබුණි. මෙම මුදල ප්‍රධාන ලෙජරයේ ආදායම් වෙනුවෙන් තැන්පත් ගිණුමට හර කිරීම වෙනුවට බැරකර තිබුණි. මෙසේ තැන්පත් ගිණුමේ හර හා බැර ශේෂයන් මාරුකර සටහන් කිරීම නිසා වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කළයුතු රු.1,731,840 ක ආදායම

ගිණුම්ගත වී නොමැති අතර තැන්පත් ගිණුමේ ශේෂයද නිවැරදිව ගිණුම් වලින් නිරූපනය නොවීය.

(ආ ) 2011 වර්ෂයට අදාල කර්මාන්ත වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු. 14,826,385 ක මුදලක් ලැබී තිබූ මුත් කර්මාන්ත ණයගැතියන්ට බැරකර තිබුණේ රු. 10,857,761 ක් පමණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට හිඟ උසාවි දඩ මුදල ගිණුම අනුව රු. 1,721,315 ක් ලෙස දක්වා තිබුණද ලිපිගොනුව අනුව හිඟ උසාවි දඩ මුදල රු. 1,201,882 ක් විය. ඒ අනුව රු. 519,433 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු. 9,508,671 ක් වු ගිණුම් විෂයයන් 15 කට අදාල ලිඛිත සාක්ෂි හා තොරතුරු ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මුල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු. 5,369,253 ක් වු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 443,030 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) | වරිපනම් හා බදු | 2,502 | 2,095 | - |
| (ii) | බදුකුලී | 9,987 | 11,434 | 1,922 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 414 | 2,222 | 25 |
| (iv) | වෙනත් ආදායම් | 10,062 | 10,493 | 17,545 |

2.2.2 වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු තක්සේරු කර අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

2.2.3 බදුකුලී

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සූරියවැව සතිපොළ , අලිඔලුආර සතිපොළ මාළු වෙළඳ සැල 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 හා 178 ප්‍රකාර ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සූරියවැව සතිපොළ භූමියේ පිහිටි කඩකාමර 26 ක් එක් කාමරයක් රු. 55,000 කට තක්සේරු කර බදුදීමේදී මූලික තැන්පතු මුදල් එකවර අය නොකර වාරික 12 කින් අයකර ගැනීම සඳහා 2007 ජනවාරි සිට දෙසැම්බර් දක්වා බදුකරුවන්ට ඉඩලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට මාස 72 ක් ගත වී ඇතත් තවදුරටත් රු. 527,060 ක් අයවීමට තිබුණි.

(ඇ) සූරියවැව සතිපොළ කඩකාමර 07 ක් එක් කාමරයක් රු. 162,000 කට තක්සේරු කර බදුදීමේදී එක්වන් මුදල් කොටස් කර අයකර ගැනීම සඳහා 2008 ජනවාරි සිට 2010 ජනවාරි දක්වා වාරික 36 කින් ගෙවා අවසන් කිරීමට බදුකරුවන්ට ඉඩ ලබාදී තිබුණද 2012 දෙසැම්බර් 31 දිනට මාස 60 ක් ගතවී ඇතත් අයවිය යුතු රු. 1,134,000 න් අයකර ගෙන තිබුණේ රු. 304,048 ක් පමණි. හිඟය රු. 829,952 ක් වූ අතර එය සම්පූර්ණ මුදලින් සියයට 73 ක් විය.

(ඈ) සූරියවැව බස් නැවතුම්පොළ අසල කඩකාමර 08 ක් එක් කාමරයක් රු. 126,000 කට තක්සේරු කර බදුදීමේදී එක්වන් මුදල් කොටස් කර අයකර ගැනීම සඳහා 2008 දෙසැම්බර් සිට 2012 මැයි දක්වා වාරික 42 කින් ගෙවා අවසන් කිරීමට බදුකරුවන්ට ඉඩ ලබාදී තිබුණද, 2012 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ එක්වන් මුදල වන රු. 1,008,000 න් රු. 191,000 ක් අයවීමට ඇති බව නිරීක්ෂණය විය.

---

(ඉ) පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු පළාත) 2012 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාර එකවර මුදල ගෙවීමේදී එය එකවර ගෙවීම අනිවාර්යය බවත් එසේ නොහැකි යැයි බදුකරු ඉල්ලීම් කරන අවස්ථාවකදී ඊට සභාවේ අනුමැතිය ලබා , උපරිම වාර හය (06) කට යටත්ව , මාස හය (06) ක් ඇතුළත එක්වන් මුදල ගෙවීමට අවස්ථාව දිය හැකි බවත් දක්වා තිබුණද කඩ කාමර එක්වන් මුදල් අයකර ගැනීමට ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) සභාව සතු කඩකාමර 42 කින් 2012 දෙසැම්බර් 31 දිනට රු. 374,650 ක් වූ හිඟ කුලී මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(උ) පළාත් පාලන කොමසාරිස්ගේ 2012 දෙසැම්බර් 27 දිනැති 2011 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 5 ඡේදය අනුව සැම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලින කළයුතු වුවත් සභාව සතු පැරණි කඩකාමර 12 හි සහ සතිපොළ නව කඩකාමර 26 හි ගිවිසුම් වසර 30 කින් පමණ යාවත්කාලීන කර නොතිබුණි.

(ඌ) අලුතින් ඉදිකරන ලද කඩකාමර 07 ට අදාලව ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බලපත්‍ර ගාස්තු ආදායම වූ රු. 24,950 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (4) වගන්තිය ප්‍රකාර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ පෞද්ගලික පන්ති පවත්වන ස්ථාන 04 කින් හා නොතාරිස් කාර්යාල 02 කින් 2012 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් කිසිදු බදු මුදලක් අයකර ගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවීය.

2.2.5 දැන්වීම් පුවරු ගාස්තු ආදායම්

---

සමාලෝචිත වර්ෂය අවසානයට පෞද්ගලික ව්‍යාපාරික අයතන 05 කින් එකතුව රු. 1,178,200 ක දැන්වීම් පුවරු ගාස්තු අයවිය යුතුව තිබුණි. තවද , බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය වන ප්‍රචාරක දැන්වීම් සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් කර නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු. 1,721,315 ක්ද මුද්දර ගාස්තු රු. 27,500 ක් ලැබිය යුතුව තිබුණි.

2.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

ජංගම පුස්තකාලයක් පවත්වාගෙන යාම සඳහා රු. 1,065,176 ක් වටිනා භාණ්ඩ 2007 වර්ෂයේදී ආසියා පදනමෙන් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ අතර ජංගම පුස්තකාලය පවත්වා තිබුණේ 2011 වසරේ මුල් කාලය දක්වා පමණි. විගණිත දිනය වූ 2012 නොවැම්බර් මස දක්වා එකී උපකරණ ඵලදායි කාර්යයට යොදවා නොමැති බව නිරීක්ෂණය විය.

2.4 අවිධිමත් ගණුදෙනු

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 53-5715 අංක දරන කැබ්රථය අලුත්වැඩියාව සඳහා මිළගණන් කැඳවා රු. 620,000 ක මුදලකට සැපයුම් කරුවෙකු තෝරාගෙන අවස්ථා 02 කදී රු. 400,000 ක මුදලක් 2012 නොවැම්බර් 09 දින වන විට ගෙවා තිබුණි. මිළගණන් කැඳවීමේදි කැබ්රථයේ කළයුතු අලුත්වැඩියාවන් හා සවිකළයුතු අමතර කොටස් පිළිබඳව ඇස්තමේන්තුවක් සකස් නොකර මිළගණන් කැඳවා අඩුම මිළගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුට අදාල අලුත්වැඩියාව ලබාදී තිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 177 හා 178 ප්‍රකාර මිළගණන් කැඳවා සැපයුම් කරුවෙකු තෝරා ගැනීමට කටයුතු නොකර සභාපතිවරයාගේ රාජකාරි ගමන් වෙනුවෙන් 2012 පෙබරවාරි සිට ඔක්තෝබර් දක්වා වූ කාලයට අදාලව එකතුව රු. 250,500 ක මුදලක් ප්‍රවාහන කුලී ලෙස සභා අරමුදලින් ගෙවා තිබුණි. රාජකාරි ගමන් සඳහා කුලී වාහන යොදා ගැනීම සඳහා ලබාගත් සභා අනුමැතියද විගණනයට ඉදිරිපත් නොවීය.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

2.5.1 නව ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම

2006 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද මෙම කර්මාන්තය අදියර තුනක් යටතේ ඇස්තමේන්තු 03 ක් සකස් කර කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු වෙත ලබාදී 2012 නොවැම්බර් 09 දින වන විට එකතුව රු. 9,249,483 ක වියදමක් දරා තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉදිකිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් නොකර අදියර වශයෙන් ඇස්තමේන්තුව සකස් කර නොතිබුණි.

(ආ) වර්ෂයක වගකීම් කාලයක් සහිතව සීඑෆ්එල් බල්බ් සහිත පෙන්ඩන්ට් ලාම්පු සපයා සවිකිරීම වෙනුවෙන් ඒකක 56 ක් සඳහා රු. 99,120 ක් ගෙවා තිබුණද 2012 නොවැම්බර් 11 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී සීඑෆ්එල් බල්බ් සවිකර නොතිබුණි.

(ඇ) පහල මාලයේ සිට ඉහළ මාලය දක්වා තිබු පඩිපෙළ කපරාරු කර වැඩ නිමකර නොතිබුණි.

(ඈ) ජනෙල්වල ග්‍රීල් සකස් කර සවිකිරීම සඳහා රු. 239,546 ක මුදලක් වැයකර තිබුණද , විධිමත් පරිදි නඩත්තු නොකිරීම නිසා සවිකර තිබු ග්‍රීල් වල මළ බැදී තිබුණි.

(ඉ) පළමු මහලේ බිත්තිවල පිපිරීම් සහ ඉරිතැලීම් නිරීක්ෂණය විය.

2.5.2 සුරියවැව නගරයේ අලුතින් කඩකාමර 04 ක් ඉදිකිරීම

සභා අරමුදල් උපයෝගී කරගෙන ඉහත කර්මාන්තය කඩ කාමර 02 ක බැගින් ඉදිකිරීම් සඳහා අනුමත සමිති දෙකක් වෙත රු. 3,796,298 මුදලකට පවරා තිබුණි. පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිවිසුම අනුව මෙම කර්මාන්තය ගිවිසුම්ගත දින සිට මාස 06 ක් තුළ නිම කළයුතු වුවත් එසේ නිම නොකිරීම නිසා 2011 දෙසැම්බර් 31 දින දක්වා ගිවිසුම්ගත කාලය දීර්ඝ කර තිබුණද 2012 නොවැම්බර් 07 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී කර්මාන්තයේ වැඩ නිමකර නොතිබු බවත් කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු අත්හැර දමා ඇති බවත් නිරීක්ෂණය විය.

(ආ) භෞතික පරීක්ෂාවේදී මෙම කඩකාමර වල අත්තිවාරම ඉදිරිපස මාර්ගයට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් පහත බවත් ඉදිරිපස ප්‍රධාන මාර්ගයේ උස සැලකිල්ලට ගෙන ගොඩනැගිලි සැලසුම් කර නොමැති බවත් නිරීක්ෂණය විය.

2.5.3 පිළිසරු ව්‍යාපෘතිය යටතේ දැල්වැට ඉදිකිරීම සඳහා භාණ්ඩ මිළදී ගැනීම

ඉහත ව්‍යාපෘතිය යටතේ දැල්වැට ඉදිකිරීම සඳහා 2011 දෙසැම්බර් 30 දින රු. 1,065,900 ක් වටිනා භාණ්ඩ මිළදීගෙන තිබුණද විගණන දිනය වූ 2012 නොවැම්බර් 09 දින වන විටත් ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණි.

## 2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරික්සණය කරනු ලැබේ.

(අ) 2012 නොවැම්බර් 09 දිනට පොදු තැන්පත් ගිණුමේ එකතුව රු. 1,530,828 ක කල් පසු වූ තැන්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) සූරියවැව බස් නැවතුම්පල අසල කඩකාමර 08 හි හිමිකරුවන් විසින් එම කඩකාමර සඳහා අනවසර ඉදිකිරීම් කර ඇති බව සභාපති අමතන ලද , නාගරික සංවර්ධන අධිකාරයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) ගේ 2012 ඔක්තෝබර් 03 දිනැති ලිපිය මගින් දැනුම්දී තිබූ අතර එම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට පියවර ගන්නා ලෙසද දන්වා තිබුණි. විගණිත දිනය වූ 2012 නොවැම්බර් 09 දින වන විටත් මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ඇ) සභා කාර්යාලය පිහිටි ඉඩම නිරවුල් කර මායිම් ලකුණු කර වැටක් හෝ තාප්පයක් ගැසිමට ක්‍රියාකර නොතිබුණි. එම නිසා ප්‍රාදේශීය සභාව පිහිටි ඉඩමෙන් කොටසක් බාහිර පාර්ශවයක් විසින් අල්ලාගෙන ඇති බවත් එම කොටසෙහි ඉදිකිරීම් කටයුතු සිදුකර ඇති බවත් නිරීක්ෂණය විය. එම බාහිර පාර්ශවයන් විසින් සභාවේ පැවැති වැට ඉවත් කර ඔවුන් විසින් වැටක් ගසා ඇති බවද නිරීක්ෂණය විය. මෙසේ සභා දේපල බාහිර පාර්ශවයක් විසින්අල්ලා ගැනීමට කටයුතු කර තිබියදී ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බවද නිරීක්ෂණය නොවීය.

(ඈ) වැය ශීර්ෂ 04 ක් වෙනුවෙන් වූ රු. 15,500,000 ක ප්‍රතිපාදනයෙන් වර්ෂය තුල වැයකර තිබුණේ රු. 8,180 ක් පමණි. මෙය මුළු ප්‍රතිපාදනයෙන් සියයට1 කටත් අඩු ප්‍රතිශතයක් විය.

## 2.7 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

---

## 03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) වාහන පරිපාලනය